**වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 31 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි කාලයේදි හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රු.885,000ක්වූ සතිපොල ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් නොකිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | සභාවට පවරා ගැනීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලැබේ. | සතිපොල ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සුසානභූමි 07ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | සභාවට පවරාගැනීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලැබේ. | සුසානභූමි 07හි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඇ) | වාහන 05ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීම නිසා මෝටර් රථ හා වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම්වල ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වාහන 05හි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඇමිණීමට කටයුතු කරනු ලැබේ. | අදාළ පනතේ විධිවිධානවලට අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158(1) වගන්තිය | හිඟ වරිපනම් බදු රු.13,809,422 ක් ගෙවීම පැහැර හැරී පුද්ගලයන්ට වරෙන්තු නිකුත් කර නොතිබුණි. | වරෙන්තු නිවේදන නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත්වූ තැන්පතු රු.1,583,999ක් නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. | නියමිත මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

(ඇ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය

| | | | |
|---|---|---|---|
| 2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛය | මහජන සේවාවන් ලැයිස්තුව සකස්කර ප්‍රදර්ශනය කර නොතිබුණි. | සංශෝධනය කිරිමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| 2018.01.24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | හැකියා වර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් මානව සම්පත් සැලැසුම් සකස් කර නොතිබු අතර සේවකයින්ට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට අඩුනොවන පුහුණුවක් ලබාදුන් බවට තහවුරු කළ නොහැකිව පැවැතුණි. | ප්‍රවර්තන වර්ෂයේ මානව සම්පත් සැලැසුම් සකස් කර පුහුණුවීම් ලබාදීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛය | දෛනික වාහන ධාවන සටහන් සෑම ඊළඟ මාසයකම 15 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව වාහන ධාවන සටහන් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | අනෙකුත් චක්‍රලේඛ 2018.07.19 දිනැති අංක 2018/e පළාත්පාලන -01 දරන පළාත්පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දි නොතිබුණි. | සේවාවන් සලසා දීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,660,931 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 74,743,374 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 9,392,873 | 9,551,813 | 13,809,422 | 9,339,672 | 9,455,490 | 9,945,885 |
| කුලී | 14,292,550 | 15,676,220 | 21,507 | 11,253,600 | 52,024,138 | 11,733 |
| බලපත්‍ර ගාස්තු | 1,951,250 | 1,967,160 | 10,500 | 1,852,500 | 2,006,506 | 24,000 |
| වෙනත් ආදායම් | 68,676,510 | 61,686,691 | 10,577,523 | 67,434,237 | 80,453,581 | 32,799,789 |
| | 94,313,182 | 88,881,884 | 24,418,952 | 89,880,009 | 143,939,715 | 42,781,407 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.143,939,715ක් වුවත්, 2019 වර්ෂයේ රැස් කළ ආදායම රු.88,881,884කින් වැඩිවී තිබුණි. මේ අනුව 2018 වර්ෂය සමග සැසීමේදි 2019 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.55,057,831කින් අඩුවී තිබුණු බව නිරික්ෂණය විය. | ඉදිරියේදී ආදායම් බිල් කර අයකිරීමට කටයුතු කරනු ලැබේ. | ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය වැඩිකිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ආ) | පසුගිය වර්ෂ 6ක කාලයක සිට ආදායම් බිල් නොකිරීමෙන් අදාළ ආදායම් රැස්කිරීමේ අකාර්යක්ෂමතාවය හෙළිදරව් කර තිබුණි. | ඉදිරියේදී ආදායම් බිල් කර හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ආදායම් බිල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිඟ වරිපනම් බදු රු.13,809,422ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | අය කරනු ලබන ප්‍රමාණය වැඩිකිරීමට කටයුතු කරනු ලැබේ. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ආ) | හිඟ ජල බදු රු.302,665 ක් අයකර ගැනීම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ජලබදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිඟ කඩකුලී රු.21,507ක් අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අය කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | හිඟ කඩකුලි අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

### 2.2.5 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිඟ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු රු.10,500 ක් අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අය කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | හිඟ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

### 2.2.6 උසාවි දඩ මුදල්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.1,321,786 ක් ලැබිය යුතුව තිබුණි. | පළාත් භාණ්ඩාගාරයට ලිපි යවා ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟ උසාවි දඩ මුදල් අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව, මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත්, මහජන සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් මූලික කරුණු 06ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා සකස් කර තිබුණි. | ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ පනතේ විධිවිධානවලට අනුව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

#### (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ සිට සිදු කරනු ලැබේ. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. |

#### (ඇ) ක්‍රියාකාරකම් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ක්‍රියාකාරකම් 03ක් නියමිත කාලය තුළ අවසන් කර නොතිබු බව නිරීක්ෂණය විය. | කාර්යයන් ක්‍රියාත්මක වෙමින් පවති. | ක්‍රියාකාරකම් නියමිත කාලය තුළ අවසන් කිරීමට කටයුතු කළ යුතුවේ. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සෞඛ්‍ය කම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණයන් සිදුකර නොතිබුණි. | වෛද්‍ය අධිකාරිවරයාට ලිපි යවා ඇත. | සෞඛ්‍ය කම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණයන් නියමිත කාලයේ සිදු කළ යුතු වේ. |
| (ii) | ජාතික ප්‍රතිපත්ති ප්‍රකාරව ඝන අපද්‍රව්‍ය වෙන් කිරිමකින් තොරව රැස් කරනු ලබන අතර ගිනි තබනු ලබන බව නිරීක්ෂණය විය. එසේම කසළ කැබැලි කර පස් දමා වසා නොතිබුණි. | අදාල මූල්‍ය ප්‍රතිපාදන ලැබූ වහාම අපද්‍රව්‍ය වෙන්කිරීම සිදු කරනු ලැබේ. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අනුව නියමිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

(ඉ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ අදාල කටයුතු සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අනුව නියමිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ නිශ්චිත අරමුණු සඳහා උපයෝජනය නොකර රු.90,842,387ක් වටිනා අරමුදල් ස්ථාවර තැන්පතු ලෙස පවත්වාගෙන ගොස් තිබුණි. | කාර්යයන් ක්‍රියාත්මක කෙරෙමින් පවතී. | ප්‍රාදේශීය සභාවේ අරමුදල් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට උපයෝජනය කළ යුතු වේ. |
| (ආ) | කොන්ත්‍රාත් කාර්යයන් සම්බන්ධයෙන් ලැබිය යුතු අත්තිකාරම් රු. 2,615,065ක් ලබාගැනිම සඳහා කටයුතු කර නොතිබුණි. | ඉල්ලීම් ලිපි යවා ඇත. | අත්තිකාරම් නියමිත කාලය තුළ නිරවුල් කළ යුතුවේ. |
| (ඇ) | පළාත් පාලන සහකාරවරයා විසින් සකස් කළ යුතු වාර්තා සකස් නොකිරීම නිසා මූලික කාර්යයන් ඉටු නොකර පැවතුණි. | වාර්තා සකස්කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | නියමිත වාර්තා අදාල කාලයේ සකස් කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| (ඇ) මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයකින් පසුවම ඉටුකර තිබුණි. | නියමිත කාලයේ සේවාවන් සැලසීමට කටයුතු කරනු ලැබේ. | නියමිත කාලයේ මහජනවට සේවාවන් සැලසීමට කටයුතු කළ යුතු වේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබු බැවින්, එවැනි මානව සම්පත් 20 ක් විසින් නිම කළයුතු සේවාවන් ප්‍රමාදවී තිබු බව විගණනයේදි නිරීක්ෂණය විය. | සම්මුඛ පරීක්ෂණ පවත්වා පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. | නියමිත කාලයේ තනතුරු පුරප්පාඩු පිරවීමට නියමිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දේපළහිමියන් 19,080කට K ආකෘති පත්‍ර බෙදාහැර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ බෙදාහැරීමට කටයුතු කරනු ලැබේ. | පනත ප්‍රකාරව K ආකෘති පත්‍ර බෙදාහැරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) සේවකයන්ට ගෙවිය යුතු රු.929,091 ක් වටිනා ගෙවීම් 34 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | අදාල අයට ගෙවීමට කටයුතු කරනු ලැබේ. | සේවකයන්ට ලබාදිය යුතු ගෙවීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පවරා නොගත් රු.22,355,483 ක් වටිනා දේපල 47 ක් සභාවේ නමට අයිතිය මාරු කර නොතිබුණි. | සභා තීරණ ලබාගැනීමෙන් පසුව ක්‍රියාමාර්ග ගනු ලැබේ. | දේපලවල අයිතිය සභාවේ නමට මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) වාහන 06 ක් සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලිපි ලේඛන නොලැබීම නිසා අයිතිය මාරු කිරීම කළ නොහැකි වී ඇත. | වාහනවල අයිතිය සභාවේ නමට මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.5.2 නිෂ්කාර්ය වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක 252-6540 දරන පිකප් වාහනය සහ WPHO 0557 දරන ට්‍රැක්ටර් වතුර බවුසරය වර්ෂ 05 සිට වර්ෂ 17 ක් දක්වා භාවිතා නොකර පැවතුණි. | අයිතිය මාරු නොකිරීම නිසා ඉදිරි ක්‍රියාමාර්ග ගත නොහැකිව ඇත. | වාහන භාවිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් සහ තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වීම අයවැයෙහි දුර්වලතායක් ලෙස අනාවරණය වි තිබුණි. | ඉදිරි කාලයේදි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කළ යුතු වේ. |